# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2020 දෙසැම්බර් මස 18 වන දින

## II වන කොටස

## අතිරේකය

(2020.12.21 දින නිකුත් කරන ලදී)

## වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)

**1975 අංක 1 දරන වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ නීතිය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන)

**1975 අංක 1 දරන වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ නීතිය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2020 අංක    දරන වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ පළමුවන උපවගන්තිය පරිච්ඡින්න කොට පහත සඳහන් වගන්ති ආදේශ කිරීම මගින් සංශෝධනය කරනු ලැබේ:—

"2. (1) මෙම නීතියේ විධිවිධාන පහත සඳහන් පන්තීන් සහ වර්ගයන්ට ගැනෙන සියලු ම තැනැත්තන්ට අදාළ විය යුතු ය:—

(අ) ජනරජයේ ජනාධිපතිතුමා;

(ආ) පාර්ලිමේන්තුවේ කථානායකතුමා;

(ඇ) කැබිනට් මණ්ඩලයේ ඇමතිවරුන්, නියෝජ්‍ය ඇමතිවරුන් සහ වෙනත් අමාත්‍යවරුන්;

(ඈ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්;

(ඉ) ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන අධිකරණ නිලධාරීන් සහ රාජ්‍ය නිලධාරීන්, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන්;

(ඊ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ (1) (ඉ) අනුව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන්;

(උ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා වලට පත්කරනු ලබන සාමාජිකයන් සහ ව්‍යවස්ථාදායක

## වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන)

**1975 අංක 1 දරන වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ නීතිය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2020 අංක     දරන වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ පළමුවන උපවගන්තිය පරිච්ඡින්න කොට පහත සඳහන් වගන්ති ආදේශ කිරීම මගින් සංශෝධනය කරනු ලැබේ:—

"2. (1) මෙම නීතියේ විධිවිධාන පහත සඳහන් පන්තීන් සහ වර්ගයන්ට ගැනෙන සියලු ම තැනැත්තන්ට අදාළ විය යුතු ය:—

(අ) ජනරජයේ ජනාධිපතිතුමා;

(ආ) පාර්ලිමේන්තුවේ කථානායකතුමා;

(ඇ) කැබිනට් මණ්ඩලයේ ඇමතිවරුන්, නියෝජ්‍ය ඇමතිවරුන් සහ වෙනත් අමාත්‍යවරුන්;

(ඈ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්;

(ඉ) ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන අධිකරණ නිලධාරීන් සහ රාජ්‍ය නිලධාරීන්, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන්;

(ඊ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ (1) (ඉ) අනුව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන්;

(උ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා වලට පත්කරනු ලබන සාමාජිකයන් සහ ව්‍යවස්ථාදායක

සභාවේ නිර්දේශය සහිතව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් කොමිෂන් සභාවක සාමාජිකයින්;

(ඌ) අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන අධිකරණ නිලධාරීන් සහ උපලේඛනගත රජයේ නිලධාරීන් සහ අමාත්‍යාංශ සහ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල මාණ්ඩලික නිලධාරීන්;

(එ) ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙන් විදේශ රාජ්‍යවල රාජ්‍ය තාන්ත්‍රික මෙහෙවර සඳහා යොදවනු ලබන මහ කොමසාරිස්වරුන්, තානාපතිවරුන් සහ කොන්සල්වරු;

(ඒ) පළාත් සභා මන්ත්‍රීවරුන්;

(ඔ) පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්;

(ඕ) 1981 අංක 15 දරන ජනාධිපති මැතිවරණ පනත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1988 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනත සහ 1946 අංක 53 දරන පළාත් පාලන මැතිවරණ ආඥා පනත යන පනත්වල සඳහන් මැතිවරණ සම්බන්ධයෙන් වන්නා වූ පිළිගත් දේශපාලන පක්ෂවල නිලධාරීන්;

(ක) 1981 අංක 15 දරන ජනාධිපති මැතිවරණ පනත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත 1988 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනත සහ 1946 අංක 56 දරන පළාත් පාලන ආයතන මැතිවරණ ආඥා පනත යන පනත් යටතේ මැතිවරණ වලට නාම යෝජනා ඉදිරිපත් කරන අපේක්ෂකයින්;

(ග) අමාත්‍යාංශ සහ රාජ්‍ය දෙපාර්තමේන්තුවල මාණ්ඩලික නිලධාරීන්;

(ච) රාජ්‍ය තාන්ත්‍රික මෙහෙවර සඳහා යොදවනු ලැබ ඇති මාණ්ඩලික නිලධාරීන්;

(ජ) රාජ්‍ය සංස්ථා සහ මණ්ඩලවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, සභාපතිවරුන්, අධ්‍යක්ෂවරුන් සහ මාණ්ඩලික නිලධාරීන්;

(ට) රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ මණ්ඩලයක් විසින් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ සමාගමක කොටස් ප්‍රාග්ධනයෙන් 25% කට නොඅඩු කොටස් ප්‍රමාණයක් හිමිකාරත්වය දරන සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, සභාපති සහ මාණ්ඩලික නිලධාරීන්;

(ඩ) 1935 අංක 14 දරන වෘත්තීය සමිති ආඥා පනත යටතේ ලියාපදිංචි වූ වෘත්තීය සමිතිවල විධායක නිලධාරීන්;

(ණ) 1839 අංක 5 දරන පුවත්පත් ආඥා පනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශකයින් ඉදිරිපත් කරනු ලැබිය යුතු පුවත්පත් ආයතන හිමිකරුවන්, කතුවරුන් සහ කර්තෘ මණ්ඩල සාමාජිකයන්; සහ

(ත) රෙගුලාසි මගින් නියම කරන්නා වූ වෙනත් කාණ්ඩ වල නිලධාරීන්.”.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වගන්තිය පරිච්ඡින්න කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීම මගින් එම වගන්තිය සංශෝධනය කරනු ලැබේ:—

“4. වත්කම් සහ වගකීම් ප්‍රකාශය පහත දැක්වෙන පරිදි භාර දිය යුතු ය:—

(අ) කථානායක වෙත-

(i) ජනරජයේ ජනාධිපති;

(ii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරු;

(ආ) ජනාධිපති වෙත -

(i) මෙම පනතේ 2 (1) වගන්තියේ (ආ), (ඇ), (ඉ), (ඊ) සහ (එ) ඡේදවල දැක්වෙන තැනැත්තන්;

(ඇ) අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත-

(i) මෙම පනතේ 2 (1) වගන්තියේ (ඌ) ඡේදයේ දැක්වෙන නිලධාරීන්;

(ඈ) අදාළ අමාත්‍යාංශයේ ලේකම් වෙත -

(i) මෙම පනතේ 2 (1) වගන්තියේ (ඒ), (ඔ), (ඛ), (බ), (ග), (ඝ), (ඞ) සහ (ඟ) ඡේදවල දැක්වෙන නිලධාරීන්;

(ඉ) මැතිවරණ කොමිසම වෙත -

(i) මෙම පනතේ 2 (1) වගන්තියේ (ඕ) සහ (ක) ඡේදවල දැක්වෙන තැනැත්තන්.”.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 (1) උපවගන්තියේ “රුපියල් දහසක් නොඉක්මවන” යන වචන ඉවත් කර ඒ වෙනුවට “රුපියල් ලක්ෂය නොඉක්මවන” යන වචන ආදේශ කිරීම මගින් එම වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

**5.** මූලික නීතියේ 10 (1) උපවගන්තියේ සඳහන් “ඇමතිතුමා විසින් රෙගුලාසි සෑදිය යුතු ය” යන වචන ඉවත් කර ඒ වෙනුවට “ජනාධිපති විසින් රෙගුලාසි සෑදිය යුතු ය” යන වචන ආදේශ කිරීම මගින් එම වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.